# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2016/30 - 2017 අප්‍රේල් මස 25 වැනි අඟහරුවාදා - 2017.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන්නා වූ සේවාවක් වන පහත උපලේඛනයේ දක්වා ඇති සේවාවන් පවත්වාගෙන යාම මහජන යහපත සඳහා අවශ්‍ය බවට තීරණය කර ඇති හෙයින්, එකී උපලේඛනයේ දක්වා ඇති සේවාවන් අත්‍යාවශ්‍ය සේවාවන් බවට ප්‍රකාශ කරන්නා වූ නියෝගයක්, (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 17 වන වගන්තියේ ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇති හෙයින් ද, එකී මහජන ආරක්ෂක ආඥා පනතේ 21 (2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය අනුව එකී ප්‍රකාශය පිළිබඳව පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු යැයි නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඒ ප්‍රකාශය නිකුත් කරනු ලැබූ දිනයේ දී පාර්ලිමේන්තුව දින දහයක් තුළ දී අවසන් නොවන්නා වූ කාල සීමාවක් සඳහා කල් තබා ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු මහජන ආරක්ෂක ආඥා පනතේ 2(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, අත්‍යාවශ්‍ය සේවා නියෝගයක් ප්‍රකාශයට පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වා සිටීම සඳහා, 2017 අප්‍රේල් මස 28 වැනි දින පෙ.ව. 9.30ට පාර්ලිමේන්තුව රැස්වීම පිණිස මේ ප්‍රකාශය මඟින් කැඳවා සිටිමි.

වර්ෂ දෙදහස් දහහතක් වූ අප්‍රේල් මස 25 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

උපලේඛනය

වීදියෙන් ඉවතලන කැළි කසළ, නිවාසවලින් ඉවතලන කැළි කසළ හෝ එබඳු වෙනත් දෑ ඉවත් කරලීම, එක්රැස් කරලීම, ප්‍රවාහනය, තාවකාලිකව ගබඩා කිරීම, පිරිසැකසුම, වෙන් කිරීම, පිළියම් යෙදීම, බැහැර කිරීම සහ විකිණීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ එබඳු යම් පළාත් පාලන ආයතනයක් සඳහා හෝ වෙනුවෙන් ඉෂ්ඨ කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන හෝ කිසියම් කාර්යය පැවරුමක් සම්බන්ධයෙන් ඉටු කරනු ලැබිය යුතු හෝ ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ කවර වුව ආකාරයේ සියලුම සේවාවන්, වැඩ හෝ ශ්‍රමය යෙදවීම.


1A - G 25075 — 617 (2017/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*